**<u>සම්මාන උපාධි පිරිනැමීම සඳහා වන කමිටුව මගින් නිර්දේශිත නාම යෝජනාව සඳහා විරෝධතා ඇත්නම් ඉදිරිපත් කිරීම</u>**
**<u>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය 50 වැනි උපාධි ප්‍රදානෝත්සවය - 2024</u>**

2024 අගෝස්තු මස 05 වැනි දින පැවති සම්මාන උපාධි පිරිනැමීම සඳහා වන කමිටුවේ දී පශ්චාද් උපාධි පීඨය විසින් ඉදිරිපත් කරන ලද නාම යෝජනාව සම්බන්ධයෙන් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 908 සහ සම්මාන උපාධි පිරිනැමීමේ නිර්ණායක අනුව ඇගයීමට ලක් කළ අතර, 2024 ඔක්තෝබර් මස කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීමට නියමිත 50 වැනි උපාධි ප්‍රදානෝත්සවයේ දී පහත සඳහන් සම්මාන උපාධිය පිරිනැමීම සුදුසු බවට නිර්දේශ විය.

| **<u>පීඨය</u>** | **<u>යෝජිත නම</u>** | **<u>යෝජිත සම්මාන උපාධිය</u>** |
|---|---|---|
| පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | සේවාර්ජිත මහාචාර්ය ස්වර්ණා පියසිරි මහත්මිය | විද්‍යාසූරි (සම්මාන) D.Sc (h.c) |

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සම්මාන උපාධි නිර්ණායක සකස් කිරීම සඳහා පත් කරන ලද සනාතන සභා අනු කමිටුවේ නිර්ණායකයන්හි පහත දැක්වෙන **<u>3.5 (1) ඡේදය පරිදි</u>** සම්මාන උපාධි පිරිනැමීම සඳහා වන කමිටුවේ නිර්දේශයන් සනාතන සභාවට දැනුම් දීමට පෙර විරෝධතා දැක්විය හැකිය.

**" සම්මාන උපාධි කමිටුවේ නිර්දේශ සනාතන සභාවට දැනුම් දීමට පෙර, සති දෙකක (02) කාල පරිච්ඡේදයක් යම් බාහිර පාර්ශ්වයකට හෝ ආයතනික සාමාජිකයින්ට විරෝධතා දැක්වීම සඳහා ලබා දිය යුතුය. දක්වනු ලබන විරෝධතා සංක්ෂිප්තව සහ ලිඛිතව සම්මාන උපාධි කමිටුවේ ලේකම් වෙත යොමු කළ යුතුය. නිර්නාමිකව ලැබෙන විරෝධතා සලකා බලනු නොලැබේ."**

ඒ අනුව ඉහත සඳහන් සම්මාන උපාධිය පිරිනැමීම සම්බන්ධව යම් විරෝධතාවක් වේ නම් එය සංක්ෂිප්තව සහ ලිඛිතව **<u>2024.08.20 දින හෝ එදිනට පෙර</u>** ලැබෙන සේ **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය "** වෙත යොමු කරන මෙන් කාරුණිකව දන්වමි

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
අධ්‍යයන ශිෂ්‍ය කටයුතු, ප්‍රකාශන හා විභාග
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ.
**2024.08.06**